
ශුභ උපන්
දිනයක් වේවා

එය මයික්ට ප්‍රීතිමත් උපන් දිනයක් විය. ඔහු ඔහුගේ දදදහහහවවවැැනනනි උඋඋපපපනනන් දිදිදිනනයය සසසැැමමමරීරීරීයයය.. ඔහුගේ උපන්දින සාදයට බොහෝ මිතුරෝ පැමිණියහ. සෑම මිතුරෙක්ම ත්‍යාගයක් ගෙනාවේය. ඔව්හු ක්‍රීඩා කළහ. කේක් හා අයිස් ක්‍රීම් කෑවෝය. ඉන්පසු මයික්ට ඔහුගේ තෑගි විවෘත කිරීමේ කාලය පැමිණියේය.

මයික් තෑගි එකින් එක ගෙන විවෘත කෙළේය. මෝටර් කාර් එකක, රොකට් එකක, ආකෘතිද ප්‍රහේලිකාවක්ද අලංකාර අත් ඔර්ලෝසුවක්ද තිබිණි. මේ සියලුම තෑගි මයික්ට ලැබුණේ නොමිලයේ වේ. ඒවා ඔහුට දෙනලද්දේ ඔහුට සැබවින්ම ඇලුම් කළ මිතුරන්ගෙනි.

මයික් බොහෝ සේ උද්‍යෝගීමත් විය. එය ඔහුගේ උපන් දිනයයි.

මීට අවුරුදු දහයකට පෙර කුඩා දරුවෙකු ලෙස ඔහු උපන් දිනය ඔව්හු සමරමින් සිටියහ. ඔහු විවෘත කළ අවසාන ත්‍යාගය ඔහුගේ හොඳම මිතුරාගෙන් විය. ත්‍යාගය තුළ චක්, කඩදාසි කැබැල්ලක් දමා
තිබිණි. කඩදාසි කැබැල්ලේ ප්‍රශ්ණයක් තිබිණි. ප්‍රශ්ණය මෙසේ වේ.

ඔබ දෙවියන්වහන්සේගේ පවුලට එක් වුයේද?
මෙම ප්‍රශ්ණය මයික්ට ප්‍රහේලිකාවක් විය. මා දෙවියන්වහන්සේගේ පවුලට එක් වුයේද? ඔහු ඔහුගෙන්ම ඇසීය.
චක්, ඔබ මින් අදහස් කරන්නේ කුමක්ද? මා දෙවියන්වහන්සේගේ පවුලට එක් වුයේද? සැබවින්ම ඔබ කිතුනුවෙක්ද? චක් ඇසීය මම පල්ලියට යන්නෙමි. ඔබ අදහස් කෙළේ එයද? මයික් පැවසීය. ඔබ දෙවියන්වහන්සේගේ පවුලට ඉපදිය යුතුය. එවිට මයික්, ඔබට උපන්දින දෙකක් සැමරිය හැකිය. ඔබ කවටකම් කරන්නෙහිය. උපන්දින දෙකක්? මයික් ඇසීය. මයික්ට මෙය මහත් ප්‍රහේලිකාවක් විය. ඔහු නැවතත් කුඩා ළදරුවෙකු වන්නේ කෙසේද? දෙවියන්වහන්සේගේ පවුලට ඔහු සම්බන්ධ වන්නේ

කෙසේද? ඔහු කිතුනුවෙකු වන්නේ කෙසේද?
ඔබ දැන් කිතුනුවෙකු බැවින් හා දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකයෙකු බැවින් සෑම දිනකම බයිබලය කියවන්න.
ඔබගේ ස්වර්ගීය පියාණන්වහන්සේ වන දෙවියන්වහන්සේට කතා කරන්න. නිතිපතාම ඉරිදා පාසැලට හා පල්ලියට යන්න.
ඔබගේ මිතුරන්ටත් ඥාතීන්ටත් යේසුස්වහන්සේ ගැන කියන්න.
සෑම කෙනෙකුටම ප්‍රේමය හා කරුණාව දක්වන්න.
සෑම අයුරකින්ම ඔබට දෙන්න.

ඔබත් මයික් මෙන්ද? ඔබත් පුදුම වන්නෙහිද? ඔබ දන්නවාද? ඔබ නොදන්නෙහි නම් දිගටම කියවන්න. උපන් දින දෙකක් ඔබටත් ලබාගත හැක්කේ කෙසේදැයි ඔබට දැනගත හැකිය.

1. සෑම කෙනෙක්ම වැරදි කර ඇති බව ඔබ දන්නෙහිද? සෑම කෙනෙක්ම පව්කර ඇතැයි බයිබලය පවසයි.
2. යේසුස්වහන්සේ කුරුසියේ මියගියේ ඔබ කර ඇති වැරදි දේවල දඩුවම තමා පිටට ගැනීමට බව ඔබ දන්නෙහිද?

3. දෙවියන්වහන්සේ සිය පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ එවන ලද්දේ මුළු ලෝකයාටම ත්‍යාගයක් ලෙස බව ඔබ දන්නෙහිද?

4. යේසුස්වහන්සේ ජීවමාන බව ඔබ දන්නෙහිද?

5. ඔබ කිතුනුවෙකු වීම දෙවියන්වහන්සේට අවශ්‍ය බව ඔබ දන්නහිද? ඉන් අදහස් වන්නේ ඔබ දෙවියන්වහන්සේගේ පවුලට නැවත උපන් බව හා ඔබට උපන්දින දෙකක් ඇති බවය. ඔබ නැවත උපදින්නට ඕනෑය. යයි යේසුස්වහන්සේ පැවසූ සේක. (යොහන් 3:7)

## දැන් දෙවියන්වහන්සේට, උන්වහනසේගේ පවුලට එක්වීම ඔබට අවශ්‍ය බව යාච්ඤාවෙන් පැවසීමට, ඔබ කැමැත්තෙහිද?

**1.** ඔබගේ වැරදි ක්‍රියාවලට ඔබට කමාවන ලෙසට දෙවියන්වහන්සේගෙන් ඉල්ලන්න. මන්ද සියල්ලෝම පව්කොට ඇත්තාහ. (රෝම 3::23)

**2.** දෙවියන්වහන්සේ සිය පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ ඔබ උදෙසා මිය යෑම සඳහා දෙන බද බව ඔබ විශ්වාස කරන්නේ යැයි දෙවියන්වහන්සේට පවසන්න. ශුද්ධ ලියවිලි ප්‍රකාර ක්‍රිස්තුස්වහන්සේ අපගේ පාප උදෙසා මළ බව පවසන්න. 1 කොරින්නි 15:3

**3.** ඔබගේම ගැලවුම්කාරයාණන් හා මිත්‍රයා වීම පිණිස යේසුස්වහන්සේ ඔබට අවශ්‍ය බව දෙවියන්වහන්සේට පවසන්න. යේසුස්වහන්සේ පිළිගත් සියල්ලන්ට දෙවියන්වහන්ගේ දරුවන් ලෙස උපත ලැබීමේ වරම උන්වහන්සේ දෙවා වදාළ සේක (යොහන් 1:12)

**4.** ඔබගේ ස්වර්ගීය පියාණන් වන දෙවියන්වහන්සේට, උන්වහන්සේගේ පුත්‍ර යේසුස්වහන්සේ දීම වෙනුවෙන් ස්තුති කරන්න. (2 කොරින්ති 9:15)

**5.** ඔබ දැන් දෙවියන්වහන්ගේගේ කිතුනු පවුලට අයත් බව යම්කෙනෙකුට පවසන්න. ලූක් 2:17 ඔබට පැවසීම සඳහා යාච්ඤාවක්

## ඔබට පැවසීම සඳහා යාච්ඤාවක්

දයාබර ස්වර්ගීය පියාණන්වහන්ස,

මා කළ වැරදි වලට කමා වන්න. ඔබගේ පුත්‍රයාණන් වන යේසුස්වහන්සේ මිය ගියේ මා උදෙසා මාගේ පාප ඉවත් කිරීමට බව මම විශ්වාස කරමි. කිතුනුවෙකු කළ යුතු ලෙස කතා කිරීමටත් ක්‍රියා කිරීමටත් මට උපකාර කරන්න. මා කරන හා කියන සියලු දෙයින්ම ඔබවහන්සේ සතුටු කිරීමට මට උපකාර කරන්න. දැන්, මට ප්‍රේම කරන හා මට උපකාර කිරීමට සූදානම්ව සිටින ඔබගේ පුත්‍ර යේසුස්වහන්සේ උදෙසා ඔබට ස්තුති කිරීමට මට අවශ්‍යය. ආමේන්.

මෙම කතාව ඔබට දෙන ලද්දේ ..... විසිනි.
මා කිතුනුවෙකු බව මා දන්නේ
බයිබලය එසේ පවසන නිසාය.

මා උන්වහන්සේගේ දරුවෙකු බව ගලාති 3:26 පවසයි.
දෙවියන්වහන්සේ මට කමාව දෙන බව 1 යොහාන් 1:9 පවසයි.
දෙවියන්වහන්සේ මට ප්‍රේමකරන බව යොහාන් 3:16 පවසයි.
මා ස්වර්ගයට යන බව යොහන් 14:2,3 පවසයි.

මාගේ නම ....................................... වේ.

මා දෙවියන්වහන්සේගේ පවුලේ
සාමාජිකයෙකු වූයේ ............................
දිනය. එය මාගේ දෙවන උපන්දිනය වේ.

ඔබ දැන් කිතුනුවෙකු බැවින් හා
දෙවියන්වහන්සේගේ පවුලේ සාමාජිකයෙකු
බැවින් සෑම දිනකම බයිබලය කියවන්න.

ඔබගේ ස්වර්ගීය පියාණන්වහන්සේ වන
දෙවියන්වහන්සේට කථා කරන්න. නිතිපතාම ඉරිදා
පාසැලට හා පල්ලියට යන්න
ඔබගේ මිතුරන්ටත් ඥාතීන්ටත් යේසුස්වහන්සෙ ගැන
කියන්න සෑම කෙනෙකුටම ප්‍රේමය හා කරුණාව දක්වන්න
සෑම අයුරකින්ම ඔබව දෙන්න

FMP
Foursquare Missions Press
© 2017